# ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අලුතින් හඳුන්වා දුන් මුදල් ප්‍රතිපත්ති උපකරණය පිළිබඳ හැඳින්වීමක්

ශ්‍රී ලංකා මහ බැංකුව[1]

---


## *සංක්ෂිප්තය*

- *ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මහජනතාවට සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත දැනුම්දෙන ක්‍රමවේදය 2024 නොවැම්බර් 27 දින සිට වෙනස් විය.*
- *මෙහිදී මහ බැංකුව දශක දෙකකට අධික කාලයක සිට ක්‍රියාත්මක කළ ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවිය.*
- *මෙම තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකය,* ***එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate: OPR)*** *ලෙස හැඳින්වේ.*
- *මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව වෙළෙඳපොළ පොලී අනුපාතික අනුගත කිරීම සඳහා මහ බැංකුව මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නියමිත කාලසීමාවේදී සමාලෝචනය කර අවශ්‍යතාව පරිදි සංශෝධනය කරනු ලැබේ.*
- *ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය හරහා උද්ධමනය 5% මට්ටමේ පවත්වා ගැනීමට ඉලක්ක කරන අතර, මෙම නව ප්‍රතිපත්තිමය වෙනසත් සමඟ එම කාර්යය තවදුරටත් කාර්යක්‍ෂම වේ.*
- *තවද, 2024 නොවැම්බර් 27 වැනි දින මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8%ක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එය සියයට 0.5ක පමණ පොලී අනුපාතික අඩු කිරීමකි.*
- *තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ පැහැදිලි බව වැඩිදියුණු කරමින්, වඩාත් දැනුම්වත් මූල්‍ය තීරණ ගැනීමේ හැකියාව ලබා දීම හරහා මහජනතාවට මෙන්ම අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ප්‍රතිලාභ ලැබෙනු ඇත. තවද, ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ වෙනස්වීම්,*


---

[1] මෙම ලිපිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදිතයි. මෙහි අන්තර්ගතය 2024 නොවැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තරාත්මක සටහන මත පදනම් වේ. https://www.cbsl.gov.lk/sites/default/files/concept_note_on_opr_e.pdf

*ඉතාමත් ඵලදායී ලෙස මූල්‍ය වෙළඳපොළට සම්ප්‍රේෂණය වීම හරහා මූල්‍ය ආයතනවල තැන්පතු සහ ණය පොලී අනුපාතිකවල වෙනස්වීම් කාර්යක්ෂමව සිදුවනු ඇත.*

**2024 නොවැම්බර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයෙන් බැහැරවී තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත යොමුවීම නිල වශයෙන් නිවේදනය කළේය. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති විකාශයේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරන මෙම තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හරහා එක්දින අන්තර් බැංකු එක්ෂණ වෙළඳපොළ පොලී අනුපාතික සඳහා පැහැදිලි ඉලක්කයක් ලබාදීම තුළින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ පැහැදිලිභාවය වැඩිදියුණු කෙරේ. මෙම ක්‍රමවේදය යටතේ, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate: OPR) හඳුන්වා දුන්නේය. මෙම ප්‍රතිපත්ති වෙනස්කම තුළින් මූල්‍ය වෙළඳපොළ සහ පුළුල් ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්තිය දැනුම්දීම මෙන්ම සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂම සහ සඵලතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.**

**තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් යටතේ මුදල් ප්‍රතිපත්ති රාමුව සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව හඳුන්වා දුන් ප්‍රධාන වෙනස්කම් මෙන්ම මෙම ක්‍රමවේදය වෙත යොමුවීම සඳහා පදනම් වූ සාධක පිළිබඳව පාඨකයා දැනුම්වත් කිරීම මෙම සටහනෙහි අරමුණ වේ.**

## ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ගමන් මග

මිල ස්ථායීතාව අරමුණු කරගත් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් පසුගිය දශක කිහිපය තුළ සැලකියයුතු ලෙස වෙනස්කම්වලට බඳුන් වී ඇත.1980 දශකය මුල් භාගයේදී මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස මුදල් සමස්ත ඉලක්කරණය භාවිතා කළ අතර, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වල ප්‍රධාන නාමික විචල්‍ය මුදල් සමස්ත විය. මෙම රාමුව යටතේ, මෙහෙයුම් විචල්‍යය සංචිත මුදල්(අධි බලැති මුදල්, පදනම් මුදල්) වූ අතර, පුළුල් මුදල් සමස්ත අතරමැදි ඉලක්කය විය. 2010 දශකය මැද භාගයේදී, මහ බැංකුව මුදල් සමස්ත ඉලක්කකරණය සහ උද්ධමන ඉලක්කකරණය යන දෙකෙහිම

ලක්ෂණ සහිත වැඩි දියුණු කළ රාමුවක් තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේය. මෙම නව ක්‍රමයත් සමඟ කෙටි කාලීන පොලී අනුපාතික වෙත වැඩි අවධානයක් යොමුවීම ආරම්භ වූ අතර, සංචිත මුදල් වෙනුවට අන්තර් බැංකු වෙළඳපොළ තුළ බැංකු අතර ගනුදෙනු සිදුවන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය මෙහෙයුම් විචල්‍යය විය.

2020 වසරේදී මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුකූලව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ලෙස යොමු විය. 2023 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික පදනම ශක්තිමත් විය. උද්ධමන ඉලක්කකරණය තුළ, පුළුල් ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්ප්‍රේෂණය වීම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතික හරහා සිදු වේ. ඒ හේතුවෙන්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යටතේ මිල ස්ථායීතාවය ළඟා කර ගැනීම සඳහා වෙළඳපොළ පදනම් කරගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ හරහා කෙටි කාලීන පොලී අනුපාතික කෙරෙහි බලපෑම් කිරීම කෙරෙහි මහ බැංකුවේ අවධානය යොමු විය.

ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය මුදල් වෙළඳපොළෙන් එක්දින පදනමින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම 1993 වසරේදී හඳුන්වා දුන් අතර, එක්දින පදනමින් ද්‍රවශීලතාව සැපයීම සඳහා ප්‍රතිවිකුණුම් පහසුකම 1995 වසරේදී හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතික සඳහා සීමාවන් ලෙස, එනම් ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතිකය පහළ සීමාව ලෙසත් ප්‍රතිවිකුණුම් අනුපාතිකය ඉහළ සීමාව ලෙසත් ක්‍රියාත්මක විය. වර්තමානයේ මෙම අනුපාතික පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) ලෙස හැඳින්වේ. ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය භාවිතා කිරීම විධිමත් ලෙස ආරම්භ කරමින් මෙම අනුපාතික දෙක මගින් සමන්විත ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව 2000 දශකයේ මුල් භාගයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් දැනුම් දීමට භාවිතා කරන ලදී. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති අරමුණු හා සමගාමීව කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා විවට වෙළඳපොළ මෙහෙයුම් සක්‍රීයව සිදු කෙරිණි.

මහ බැංකුව, කලින් කලට, පවතින ප්‍රතිපත්ති උපකරණවල සඵලතාව මෙන්ම එම උපකරණ හරහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළ වෙත සංඥා කිරීමේ හැකියාව පිළිබඳව ඇගයීමට ලක් කරයි. මෙම ඇගයීම් ක්‍රියාකාරකම් යටතට ලෝකයේ අනෙකුත් රටවල මහ බැංකු භාවිතයන් අධ්‍යයනය කිරීම සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ තාක්ෂණික උපදේශන ලබාගැනීම ඇතුළත් වේ. මෑතකදී සිදු කරන ලද එවැනි ඇගයීම් වලින් පසුව, ද්විත්ව පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් කරා ගමන් කිරීමේ සිය අභිප්‍රාය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 වසර සඳහා වන සිය වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා වසර මුලදී නිවේදනය කරන ලදී.

ඒ අනුව, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත ගමන් කිරීමට අදාළව අධ්‍යයනය කිරීම සහ ඊට අවශ්‍ය සහාය සැලසීම සඳහා මහ බැංකුව තාක්ෂණික කාර්ය මණ්ඩලයෙන් සමන්විත අධ්‍යයන කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. මෙම කණ්ඩායම විසින් තනි මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය පිළිබඳ ගෝලීය අත්දැකීම් සමාලෝචනයට ලක් කරමින් තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අදාළව ඉදිරි දැක්මක් සමඟින් ශ්‍රී ලංකාවට වඩාත් සුදුසු ක්‍රමවේදයක් යෝජනා කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුව සමඟ පැවති සාකච්ඡාවලින් අනතුරුව එහි නිර්දේශ අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අනුමැතියෙන් පසුව, යෝජිත තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර මූල්‍ය වෙළඳපොළ සහභාගිවන්නන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

## මේ දක්වා අනුගමනය කළ ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමය වෙනස් කිරීම අවශ්‍ය වූයේ ඇයි?

2024 නොවැම්බර් 26 වැනි දින දක්වා, මහ බැංකුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සහ පහළ සීමාවන් නිර්ණය කරන නිත්‍ය ණය පොලී අනුපාතිකය සහ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යන ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙක නිවේදනය කිරීම හරහා කොරිඩෝ පද්ධතියක් යටතේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදු කරන ලදී. මෙම කොරිඩෝව මගින් මහ බැංකුවේ උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියා කරන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මගින් පිළිබිඹු වන අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ එක්දින පොලී අනුපාතික සඳහා මඟ පෙන්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය නිත්‍ය පොලී

අනුපාතික කොරිඩෝව තුළ අන්තර් බැංකු ගනුදෙනු සඳහා නිශ්චිත ලක්ෂ්‍ය ඉලක්කයක් සඳහන් නොකර නිත්‍ය ණය පොලී අනුපාතිකයේ සහ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයේ මට්ටම් ප්‍රකාශයට පත් කරමින් මහජනතාවට තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ පැහැදිලිව දක්වන ලද මෙහෙයුම් ඉලක්කයක් නොමැති වීම හේතුවෙන්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ විචලනයවීම සඳහා ඉඩකඩ පැවතුණි. අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය පැවතිය යුතු මට්ටම පිළිබඳව මහ බැංකුව දැන සිටියද, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය හැසිරිය යුතු නිශ්චිත ස්ථානය පිළිබඳව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ සඳහන් නොවීය. මෙම සංකීර්ණත්වය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ විවරණයේදී අභියෝග ඇති කළේය.

තවද, නිත්‍ය පහසුකම් අනුපාතික, ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස භාවිතා කිරීමේදී මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයට අදාළව මිශ්‍ර සංඥා ඇති කිරීමට හේතු විය. පෙර ක්‍රමවේදය යටතේ, මහ බැංකුවේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි ඉලක්කගත මට්ටම පිළිබඳව වෙළඳපොළ සහභාගිවන්නන් විසින් දැන සිටියේ නැත. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මහ බැංකුව අභ්‍යන්තරව පිළිගත් මට්ටමට එනම් වෙළඳපොළ තත්ත්වයන් අනුව වඩාත් සුදුසු යැයි මහ බැංකුව නිර්ණය කරන මට්ටමට ගෙන ඒම සඳහා සිදු කරන ලද මෙහෙයුම්, ඇතැම් පාර්ශ්වකරුවන් විසින් ප්‍රශ්න කරන ලදී. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව මහ බැංකුවේ මැදිහත්වීම් හේතුවෙන් හෝ, අන්තර් බැංකු වෙළඳපොළ විෂමතා සමනය කිරීම සඳහා විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම හේතුවෙන් හෝ වෙළඳපොළ තත්ත්වයන් හේතුවෙන්, පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි සිදුවන විචලනයන් වෙළඳපොළ සහභාගිවන්නන්ට විවිධ අයුරින් අර්ථ දැක්විය හැකිය. ඇතැම් පාර්ශ්ව මෙම විචලනයන් ප්‍රතිපත්තිමය ක්‍රියා ලෙස සලකන අතර තවත් අය ඒවා සාමාන්‍ය වෙළඳපොළ හැසිරීම් ලෙස සැලකිය හැකිය. පෙර ක්‍රමවේදයේ මෙම නිශ්චිත ඉලක්කයක් නොමැතිකම හේතුවෙන් මුදල් ප්‍රතිපත්ති සංඥා මිශ්‍ර ස්වභාවයක් ගැනීම සහ

මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව අඩුවීම ඇතුළු අභියෝග කිහිපයක් නිර්මාණය වී තිබුණි.

## මුදල් ප්‍රතිපත්ති රාමුව සඳහා අලුතින් හඳුන්වා දුන් ප්‍රධාන වෙනස්කම්

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව 2024 නොවැම්බර් මස 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එහි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate: OPR) හඳුන්වා දෙන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ දේශීය මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති සමාලෝචනවලදී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සුදුසු මට්ටම කාලානුරූපව සමාලෝචනය කෙරේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ අවශ්‍ය ගැළපීම සිදුකරනු ඇති අතර, එවැනි වෙනස්කම් මහජනතාවට විනිවිද භාවයෙන් යුතුව සන්නිවේදනය කෙරේ. මෙම ප්‍රතිපත්ති වෙනස් කිරීමත් සමඟ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව ඉලක්ක කරයි. මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමනය ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඛණ්ඩව පවතිනු ඇත. මෙම තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයට සංක්‍රමණය වීමත් සමඟ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ.

## නව ක්‍රමවේදය යටතේ මෙහෙයුම් රාමුවෙහි ව්‍යුහය

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ අවට පවත්වාගෙන යාම සඳහා තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය යටතේ මහ බැංකුව විවට වෙළෙඳපොළ කටයුතු අඛණ්ඩව සිදු කරයි. නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම යන නිත්‍ය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්දින පදනම මත ගනුදෙනු කිරීම සඳහා සහභාගිත්ව ආයතන සඳහා අඛණ්ඩව ලබා දෙනු ඇත. මෙම පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු

පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, මහ බැංකුව විසින් කලින් තීරණය කරනු ලබන ආන්තිකයන් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ. දැනට, මෙම සීමා එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වටා සමමිතික වන අතර, වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කර ඇත.

2024 නොවැම්බර් මස 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, මහ බැංකුව එහි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ සිට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත ගමන් කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 8.00ක් ලෙස තීරණය කළේය. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක ± 50ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කර ඇත. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.50ක් සහ සියයට 8.50ක් වේ. මෙම අනුපාතික අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතික සඳහා පහළ සහ ඉහළ සීමාවන් ලෙස දිගටම ක්‍රියා කරනු ඇති නමුත් ඒවා තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස ක්‍රියා නොකරනු ඇත.

***තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ මෙහෙයුම් ව්‍යුහය***




සටහන: මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ තීරණය මත නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ (එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ) සිට සමාන ආන්තිකයකින් හෝ වෙනස් ආන්තිකයකින් පවත්වා ගත හැකිය.

## තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් හඳුන්වාදීම මගින් අපේක්ෂිත ප්‍රතිලාභ

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ ප්‍රතිලාභ කිහිපයක් ඇත. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් මගින් මුදල් ප්‍රතිපත්ති තීරණවල විනිවිදභාවය සහ ඒවායේ සන්නිවේදනය සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරයි. එය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය කිරීම, වෙළෙඳපොළ අපේක්ෂා පාලනය කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සඳහා පහසුකම් සැලසීමට අදාළව වඩාත් ඵලදායී වේ. කෙටිකාලීන ද්‍රවශීලතා වෙනස්වීම් හෝ වෙනත් බාහිර සාධක හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ තාවකාලික විචලනයන් සමස්ත වෙළඳපොළ හැසිරීම කෙරෙහි බලපෑම් කිරීමට ඇති අවස්ථාව අඩුය. ඒ, එවැනි විචලනයන්ගෙන් ස්වාධීනව ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හරහා මහ බැංකුවේ ප්‍රතිපත්ති ස්ථාවරය පැහැදිලිව ප්‍රකාශ කර ඇති බැවිනි. මෙම පැහැදිලි බව තුළින් අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික නිර්ණය සඳහා ස්ථාවර පදනමක් ලබා දීම හරහා මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය පමණක් නොව මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ද ශක්තිමත් කරයි.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් යටතේ, මහ බැංකුවට සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මූල්‍ය වෙළඳපොළ, මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය කිරීම පහසු වේ. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි ඕනෑම වෙනස්කමක් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පවත්වනු ලබන මුදල් ප්‍රතිපත්ති සමාලෝචන හරහා ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මෙම වෙනස්කම් මාධ්‍ය නිවේදන, මාධ්‍ය සාකච්ඡා සහ සමාන වෙනත් නාලිකා හරහා මහජනතාවට සන්නිවේදනය කරනු ලැබේ. මෙමගින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ පැහැදිලිභාවය සහතික කෙරේ. මෙම සෘජු ප්‍රවේශය අවිනිශ්චිතතා අවම කරන අතර මහ බැංකුවේ ක්‍රියාවන් සහ අභිප්‍රායයන් කෙරෙහි විශ්වාසය ඇති කරයි.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය තුළ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සඳහා

පහළ සීමාව සහ ඉහළ සීමාව ලෙස අඛණ්ඩව පවතින අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු විචලනයකින් යුතුව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති අනුපාතිකයට හෝ ඊට ආසන්නව පවත්වා ගැනීම විවට වෙළඳපොළ කටයුතු මගින් සිදු කෙරේ. සමහර අවස්ථාවලදී, තාවකාලික ද්‍රවශීලතා උච්චාවචනයන් හෝ අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙන් බැහැර විය හැකිය. කෙසේ වුවත්, ප්‍රතිපත්ති ස්ථාවරයේ සිදුවන වෙනස්කම් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි වෙනස්කම් හරහා සන්නිවේදනය කරන බැවින්, වෙළඳපොළ සහභාගිවන්නන් එවැනි බැහැරවීම් තාවකාලික ලෙස හඳුනාගනු ඇති අතර ප්‍රතිපත්තිමය වෙනසක් ලෙස හඳුනා නොගනු ඇත.

***තනි ප්‍රතිපත්ති අනුපාතික ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම, වෙළඳපොළ සහ පුළුල් ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ සහ සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුවේ අඛණ්ඩ ප්‍රයත්නයන්හි වැදගත් පියවරක් සනිටුහන් කරයි. සිය මුදල් ප්‍රතිපත්ති රාමුව සහ මෙහෙයුම් උපාය මාර්ග, වෙනස් වන දේශීය හා ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව මෙන්ම ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්ට අනුව, අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුව කැපවී සිටී.***